පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

# දෙවන වාර පරීක්ෂණය - 2019

## නර්තනය- I

පාසලේ නම : ..............................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..............................................................................

කාලය : පැය 1 යි.

Education NCP - www.edncp.lk

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 1 සිට 10 තෙක් ප්‍රශ්න වලට හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

01. ................................ වන්නම උපහාස රසය ඉස්මතු කිරීමට නිර්මාණය වූවකි.

i.උකුසා ii. මයුරා iii.සිංහරාජ iv. මුසලඩි

02. කසී රටෙහි ගුරුහාමි නමින් යුත් ................................ සොකරියගේ ස්වාමි පුරුෂයා වේ.

i.ආඩිගුරු ii. වෙදරාල iii. අඬබෙරකරු iv. මෙහෙකරුවෙක්

03. මහනුවර දළදා පෙරහැර අවසානයේදී ................................ පවත්වයි.

i.කොහොඹා කංකාරි ශාන්තිකර්මය ii.වලියක් මංගල්‍ය ශාන්තිකර්මය

iii.දෙවොල්මඩු ශාන්ති කර්මය iv.පහන් මඩු හාන්ති කර්මය

04. “සම්මා සම්බුද්ධ ඥානේන...” යන ගායනය ................................ ගායනා විශේෂයකි.

i.තාලාත්මක ii. ආඝාතාත්මක iii. අනාඝාතාත්මක iv.ලයාන්විත

05. පසුතල නිර්මාණ ................................ අභිනයට අයත් වේ.

i.ආංගික ii. ආහාර්යය iii. සාත්වික iv.සාත්වික

06. සැවුලා වන්නම ................................ දෙතිතට අයත් වන්නමකි .

i. මාත්‍රා 3+4 ii. මාත්‍රා 4+4 iii.මාත්‍රා 2+2 iv. මාත්‍රා 2+4

07. අංග , වර්ණ හා හැඩතල උපයෝගී කර අවශ්‍ය ආකාරයට හැඩගැන්වීම ................................ වේ

i. අංග රචනය ii.රංග රචනය iii.පද රචනය iv. තිර රචනය

08. පහතරට වන්නමක කොටස් ................................ යුක්ත වේ .

i.6 කින් ii.5 කින් iii. 4 කින් iv.8 කින්

09. ඉබන් බතුතා විසින් නර්තනය පිළිබඳ වාර්තා කර ඇත්තේ ................................ ග්‍රන්ථයේය.

i. හෙළ ගී මග ii.එදා හෙළ දිව iii.විදේශියන් දුටු පුරාණ ලංකාව iv. සිංහල ගැමි නාටක

10. “නන් උතුම් පෙම්බර......” යන කවිය ................................ කව්වලට අයත් වේ.

i.චාමර ii.රබන් iii.කල iv.සවරම්

11.



ඉහත ජායාරූප යෙන් පිළිබිඹු වන කර්මාන්තය වනුයේ

i. පතල් කර්මාන්තය ii.කුඹල් කර්මාන්තය
iii. කොහු කර්මාන්තය iv.ධීවර කර්මාන්තය

12. 11 වන ගොඩ සරඹය හඳුන්වන සරඹ නාමය වනුයේ

i.බඹර සරඹය ii. චන්ද්‍රිකා සරඹය
iii.පැනීමේ සරඹය iv. අර්ධ චක්‍ර සරඹ

13. "කරනම් අඩිය" යනු කී වෙනි පා සරඹයද

i. 6 වන සරඹ යයි ii.7 වන සරඹ යයි
iii.9 වන සරඹ යයි iv. 8 වන සරඹ යයි

14. දුරත් බැලුම නොව................................ මෙහි ඉතිරි පද කොටස වනුයේ

i. ළඟත් බලන අය ii. හටත් මෙලය වෙයි
iii.කැටත්තබම් දඩ iv.වටත් අයට

15. කතරගම දෙවියන් හා , පත්තිනි දෙවියන් ඇදහීමකට ලක්කරන ගැමි නාටකය වනුයේ

i.කෝලම් ii. සොකරි
iii.රූකඩ iv. නාඩගම්

16. කරදිය මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද වර්ෂය වන්නේ

i.1961 ii.1965
iii.1964 iv. 1968

17. කරදිය මුද්‍රානාට්‍ය හි ආලෝකකරණය සිදු කරන ලද්දේ

i.ලයනල් අල්ගම ii.සෝමබන්දු විද්‍යාපති
iii.සේනවළවේ iv.මහින්ද ඩයස්

18. මහළු චරිතයක් අංග රචනය කිරීම

i. ස්වාභාවික අංග රචනයයි. ii. සරල අංග රචනයයි
iii. භාවාත්මක අංග රචනයයි iv. චර්තාංග අංග රචනයයි

19. ග්‍රීක නාට්‍යක් ඇසුරෙන් නිර්මාණය වූ නාට්‍ය ගීතයක් වනුයේ

i.විදුර ii.බෙරහඬ
iii.රතු හැට්ටකාරී iv. නරිබෑනා

20. "විදුර නූර්තිය" රචනා කරන ලද්දේ

i. බන්දුල ජයවර්ධන මහතා ii.එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
iii. චාර්ල්ස් ඩයස් මහතා iv. තිස්ස කාරිය වසම් මහතා

21. දුටුගැමුණු රජතුමා වඩුවන් රැස් කර අණබෙර වැයූ බව කියැවෙන වංශ කතාව වනුයේ

i. මහා වංශය ii.දීප වංශය
iii.චූල වංශය iv.ථූප වංශය

22. දවුල සුදු රෙදි කඩකින් වසා වාදනය සිදුකරනුයේ කුමන අවස්ථාවේ ද?

i.රණ බෙර වැයීමේදී ii. මළ බෙර වැයීමේදී
iii.අණ බෙර වැයිමේදී iv.වද බෙර වැදීමේදී

Education NCP - www.edncp.lk

23. දළදා කරඬුව අඹරාව යටින් පිටතට වැඩම වීමේදී සිදු කරනු ලබන හේවිසි වාදනය හඳුන්වනු ලබන්නේ.
i. අඹරා හේවිසි
ii. ගෙවදුම් හේවිසි
iii. අලුයම් ධුර හේවිසි
iv. හැන්දෑධුර හේවිසි

24. දෙවන බෙර සරඹය වනුයේ
i. තකට කුදට
ii. තක්කඩ කුද
iii. තකට කුද
iv. කුදට

25. අනුරාධපුර යුගයේ ආරම්භක රජු ලෙස සැලකෙන්නනේ,
i. පඬුවස් දෙව් රජු
ii. පණ්ඩුකාභය රජු
iii. දුටුගැමුණු රජු
iv. දේවානම්පියතිස්ස රජු

26. පරාක්‍රමබාහු රජු විසින් නැටුම් ගැයුම් වැයුම් සඳහා ඉදි කරන ලද මණ්ඩපය වන්නේ
i. කවිකාර මණ්ඩපය
ii. නිශ්ශංක ලතා මණ්ඩපය
iii. සරස්වතී මණ්ඩපය
iv. දේව මණ්ඩපය

27. ලී කෙළි නැටුමක කැටයමක් සහිත රූකම් මාලාවක් දක්නට ඇත්තේ,
i. ඇම්බැක්කේ දේවාලයේ
ii. ගඩලාදෙණිය විහාරයේ
iii. ලංකාතිලක විහාරයේ
iv. ගලපාත විහාරයේ

28. රනින් කල බෙර අටක් වාදනය කරමින් ගිරිභණ්ඩ උත්සවයක් කළ රජු වන්නේ
i. මහා පරාක්‍රමබාහු රජු
ii. දුටුගැමුණු රජතුමා
iii.මහා දැලියාමාන රජු
iv. කාවන්තිස්ස රජතුමා

- දී ඇති රූප සටහනෙන් පිළිතුරු සපයන්න.




29. B අකුරෙන් දක්වා ඇත්තේ ගැටබෙර ඇසෙහි විශ්කම්භයයි. එහි සම්මත දිග ප්‍රමාණය වනුයේ
i. රියනකි
ii. අඟලකි
iii.වියතකි
iv.විශ්ගුස්සකි

30. A අකුරේ දක්වෙන්නේ ගැට බෙරයේ,
i.බෙර හැක්මයි
ii.කැපුම් හමයි
iii.බෙර ලණුවයි
iv.බෙර කඳයි

31. “දොං දොං ජිං ජිං ගජි ගත” යන බෙර පදයේ වාදනයට අනුව ගායනය කළ හැකි කවි පදයකි.
i. සත් වෙත් මහත් අදර
ii.සුරිඳුන් පෙර සිටින්
iii.ඉපිද ඒ බෝසත්
iv. අගය වඩන කවි වරුණ

32. නර්තනය ප්‍රධාන මාධ්‍ය කොට ගෙන චරිත නිරූපණය සිදු කෙරෙන නාට්‍ය විශේෂය වන්නේ,
i. මුද්‍රා නාට්‍යයි
ii.ශෛලිගත නාට්‍යයයි
iii.ගීත නාට්‍යයි
iv.ස්වාභාවික නාට්‍යයයි

Education NCP www.edncp.lk

- පහත දැක්වෙන වගුව ඇසුරෙන් 33 - 34 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| පේළිය | i තීරුව | ii තීරුව | iii තීරුව |
|---|---|---|---|
| A | කොහොඹා කංකාරිය | දෙවොල් මඩුව | පහන් මඩුව |
| B | මෙලෙයි යකුන් | බණ්ඩාර දෙවි හත්කට්ටුව | කඩවර යකුන් |
| C | පත්තිනි | සපිරිවාර දෙවිවරු | දෙවොල් දෙවි |
| D | අසුර යක්කම | ඌරා යක්කම | දෙවොල් ගොඩ බැසීම |

33. පිළිවලින් පහතරට , සබරගමු , සහ උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කර්ම සඳහන් වන්නේ,
    i. A පේළියේ ii , iii හා i තීරුවලයි  ii. A පේළියේ iii , ii හා i තීරුවලයි
    iii. A පේළියේ i , ii හා iii තීරුවලයි  iv. A පේළියේ iii , i හා ii තීරුවලයි

34. කොහොඹා කංකාරිය , දෙවොල් මඩුව හා පහන් මඩුව යන ශාන්ති කර්ම වලට අදාළ නාට්‍යමය අවස්ථා අනුපිළිවෙලින් සඳහන් කරන්න.
    i. D පේළියේ i , ii හා iii තීරුවලයි  ii. D පේළියේ iii , ii හා i තීරුවලයි
    iii. D පේළියේ ii , iii හා i තීරුවලයි  iv. B පේළියේ ii , i හා iii තීරුවලයි

35. කුවේණියගේ ශාපයෙන් රෝගාතුර වූයේ
    i. මලය රජු  ii. විජය රජු
    iii. ගජබා රජුය  iv. පඬුවස් දෙව් රජුය

36. “තෙයි ති තා තෙයි” යනු
    i. පළමුවන පා සරඹයයි  ii.හයවන පා සරඹයයි
    iii.පස්වන පා සරඹයයි  iv. දෙවන පා සරඹයයි

37. නර්තන ක්‍රියාකාරකම් තුළින් වර්ධනය වන හැකියාවක් නොවන්නේ,
    i. නිර්මාණශීලි චින්තනය  ii.නීති රීති පිළිනොපැදීම
    iii. බෙදා හදා ගැනීම  iv.නායකත්වයට ගරු කිරීම

38. කරදිය මුදා නාට්‍යයේ සිසිගේ චරිතයට රංගන දායකත්වය ලබාදුන්නේ
    i. වජිරා චිත්‍රසේන මහත්මිය  ii.මිරැන්ඩා හේමලතා මහත්මිය
    iii.මේරියම්ද සොයිසා මහත්මිය  iv.චන්ද්‍ර ලේඛා පෙරේරා මහත්මිය

39. සිරිබෝ භාමි , නිත්තවෙල ගුණයා යන ශිල්පීන් වඩාත් ප්‍රසිද්ධියට පත් වූ නර්තන සම්ප්‍රදායයන් වනුයේ
    i. උඩරට , සබරගමු  ii.සබරගමු , පහතරට
    iii.සබරගමු, උඩරට  iv.පහතරට, උඩරට

40. වීරත්වය විදහා පාන ගැමි නැටුමක් ලෙස
    i. ලී කෙළි නැටුම  ii. කඩු නැටුම
    iii. චාමර නැටුම  iv. සවරම් නැටුම

(ල 1x40=40)

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 10 |

# දෙවන වාර පරීක්ෂණය - 2019

## නර්තනය- II

පාසලේ නම : .......................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..........................................................

..........................................................

කාලය : පැය 2 යි.

Education NCP - www.edncp.lk

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

01. i. විශ්මය නැමැති ස්ථායි භාවයෙන් ......................................... රසය උපදී.

ii. ජය ජය සිංහ නරේන්ද්‍රා මෙය ......................................... කවියකි.

iii. සොත්තානා යනු .........................................සේවකයාය.

iv. නර්තනය ප්‍රධාන මාධ්‍ය කොටගෙන චරිත නිරූපණය සිදු කරන නාට්‍ය විශේෂය .........................................නම් වේ.

v. භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව ලෝක ධර්මී හා .........................................යනුවෙන් නාට්‍ය ශෛලීන් දෙකකි

vi. ලංකාවේ වසර දහඅටක් සිරකරුවෙකු ලෙස සිටි......................................... විසින් එදා හෙළදිව ග්‍රන්ථය ලියන ලදී

vii. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජුගේ නෘත්‍ය මණ්ඩලයට වන්නම් රචනා කරන ලද්දේ .....................................විසිනි.

viii. වේශ නිරූපණය අයත් වන්නේ සතර අභිනයෙන් .........................................අභිනයටය.

ix. සබරගමු නර්තන සම්ප්‍රදායේ "කලාසම" යන්නට සමාන වන උඩරට , පහතරට, නර්තන කොටස නම් කරන්න.

i. උඩරට - .................................................

ii. පහතරට - .................................................

x. සම්ප්‍රදායික හේවිසි වාදනයේදී ප්‍රධාන වශයෙන් භාවිතා කෙරෙන විතත භාණ්ඩය සහ සුසිර භාණ්ඩය කුමක්ද?

i. විතත භාණ්ඩය - .................................................

ii. සුසිර භාණ්ඩය - ................................................. ( ල. 1 × 12)

02. i. සුළු මහ දෙකිතට අයත් (2+4) බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල. 02)

ii. "සොබන් දෙව්වරු සඳෙනෙක් එතැනට........" චාමර කවි මාත්‍රා (4+4) තනි තිතට ප්‍රස්ථාර කරන්න. (ල. 05)

iii.සිංහරාජ වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න. (ල. 05)

03. පහත මාතෘකා අතුරින් තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. වන්නම්

ii. දේශීය වාද්‍ය භාණ්ඩ

iii. ජීවන වෘත්තින් හා බැඳි ජන ගායනා

iv. නර්තනය හා මානසික ස්වස්තකාවය

v. ගැමි නැටුම් (ල 4 ×3 )

04. i. සොකරි ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු 2ක් නම් කරන්න. (ල. 02)

ii. සොකරි නාටකයේ ගායනය හා වාදනය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)

iii. සොකරි නාටකයේ එක් චරිතයක් පිළිබඳ විචාරයට ලක් කරන්න. (ල. 06)

05. i. කරදිය මුද්‍රා නාට්‍යයට පසුබිම් වූ කතා පුවත කෙටියෙන් ලියන්න. (ල. 04)

ii. කරදිය මුද්‍රා නාට්‍යයේ රංගවස්ත්‍රාභරණ පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල. 04)

iii. මෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 04)

06. i. සන්නිවේදනය සඳහා භාවිත වන වාද්‍ය භාණ්ඩ නම් කරන්න. (ල. 02)

ii. අතීතයේ සන්නිවේදනය සඳහා වාද්‍ය භාණ්ඩ වාදනය කළ අවස්ථා 04ක් නම් කරන්න. (ල. 04)

iii. ඉන් අවස්ථා දෙකක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල. 06)

07. i. අංග රචනය යනු කුමක්දැයි විස්තර කරන්න. (ල. 02)

ii. අංග රචනය සඳහා යොදා ගන්නා ආලේපන ද්‍රව්‍ය 04 ක් නම් කරන්න. (ල. 04)

iii. අංග රචනය කිරීමෙන් නළුවාට ඇති ප්‍රයෝජන දෙකක් නම් කර එක් කරුණක් පිළිබඳ කෙටියෙන් ලියන්න. (ල. 06)

Education NCP - www.edncp.lk

PAST PAPERS WIKI

දෙවන වාර පරීක්ෂණය -2019
නර්තනය 10 - ශ්‍රේණිය

1. iii
2. i
3. ii
4. iii
5. ii
6. iv
7. i
8. iii
9. iii
10. ii
11. ii
12. iii
13. iv
14. i
15. ii
16. i
17. iv
18. iv
19. ii
20. iii
21. iv
22. ii
23. i
24. i
25. ii
26. iii
27. i
28. iii
29. iv
30. iii
31. ii
32. i
33. i
34. iii
35. iv
36. iii
37. ii
38. i
39. iii
40. ii

PAST PAPERS WIKI


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440